ප්‍රේමදාසගෙන් තාත්තාටත් පාඩමක්

ආචාර්. ප්‍රේමදාස ශ්‍රී ලංකාවේ සිටි අපූරු නායකයෙකි. ඔහු තරම් ජනතාවගෙන් බැනුම් ඇසූ නායකයෙකු නැති තරමිය. එහෙත් ඔහු මෙරට බිහිවූ සාමාන්‍ය ජනතාවට සේවය කළ නායකයන් අතලොස්සෙන් කෙනෙකු බව ඔහුගේ විරුද්ධවාදීහු පවා කියති. මැයි පළමුවනදාක කොටි බෝම්බ ප්‍රහාරයකින් මිය ගිය ඔහුගේ ජීවිතයේ රසඉසුපු තැන් කීපයකි මේ.

ඔහු ඉපදුණේ කොළඹ කෙසෙල්වත්තේය. ඒ සාමාන්‍ය පවුලක දුක්විඳින දරුවකු ලෙසය. එහෙත් අවසානයේ දී නතරවූයේ රජ ගෙදරය. ඒ ද අන් කිසිවකු ලෙස නොව රටේ නායකයා ලෙසය. මේ තැනැත්තා අන් කවුරුවත් නොව ආර්.ප්‍රේමදාසය. එසේ නොමැතිනම් රණසිංහ ප්‍රේමදාසය.

ධෛර්ය, වීර්යය, කැපවීම, උත්සාහය ඔස්සේ ජීවිතය ජයගත් ඔහු නාගරික මන්ත්‍රීවරයකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, අගමැතිවරයෙකු හා ජනාධිපතිවරයෙකු ලෙස දේශපාලන ලෝකය ජය ගත්තේය. පසු කාලීනව තමාගේත්, තමා වටා සිටි පිරිසගේත් අඩුපාඩුකම් නිසා බරපතල විවේචනයකට බඳුන් වුවත් ඔහු මෙරටට කළ සේවයද මහත්ය. ඒ බව ඔහුට ප්‍රියකරන අය පමණක් නොව ඔහුගේ විරුද්ධවාදීහු ද පිළිගනිති.

ප්‍රේමදාසගෙන් තාත්තාටත් පාඩමක්

අප මේ කියන්නට යන කතාව ප්‍රේමදාස දේශපාලනයට පිවිසි මුල් යුගයේ සිදුවූවකි. නිශ්චිතව කියනවා නම් එක්දහස් නවසිය පනස් නවය අවුරුද්දේ සිදුවූවකි. එවකට ආර්.ප්‍රේමදාස කොළඹ නගර සභාවේ සභාපති බස්තියම කොට්ඨාශයේ නාගරික මන්ත්‍රීවරයා වූයේය.

සාන්ත බස්තියම කොට්ඨාශය විවිධ මිනිසුන්ගේ මෙන්ම විවිධ ජනාවාසවල ද සංඝනනයක් විය. පැල්පත් මුඩුක්තු ආදියෙන් පිරුණු වත්ත මෙන්ම තරමක හොඳ තත්වයේ නිවාසද එහි විය. ප්‍රේමදාස මේ සැම අස්සක් මුල්පාකම රිංගුවේය. ජනතාවගේ ඕනෑ එපාකම් පිළිබඳ සොයාබලුවේය. එහිදී ඔහු වඩාත් උනන්දු වූයේ පිරිසිදුකම ගැනය. පිරිසිදුව සිටීම ගැන පරිසරය සුරැකීමේ වැදගත්කම ගැන ජනතාවට දීප්ත ලෙස කරුණු කීවේය. මෙසේ කරුණු පැහැදිලි කරමින් යන අතරතුර දිනක් ඔහු සාන්ත බස්තියම කොට්ඨාශයේ පිහිටි සිය මහ ගෙදරට ද ගොඩ වීය. වටාපිටාවේ පරිසරය ඔහුගේ සිත්ගත්තේ නැත.

"මොකද මේ? හැම තැනම කාණු පිරිල. වැසිකිළිත් උතුරනව. කිසිම පිරිසිදුකමක් නැහැ." ප්‍රේමදාස තම පියාට දොම්නාරෝපණය කළේය.

"හ්ම්. ඒව එහෙම තමයි. මම මොනව කරන්නද?" පුතාගේ ගෝරනාඩුවෙන් කෝපගැන්වුණු පියා ගොරෝසු උත්තරයක් දුන්නේය.

"එහෙම කියල හරියන්නෙ නෑ. මේව ඉක්මණට පිළියළ කරන්න ඕන. කාණුවල වතුර බහින්න සලස්වල, වැසිකිළි පිරිසිදු කරන්න ඕන..." පියාගේ ගොරෝසු උත්තරය ගණනකට නොගත් ප්‍රේමදාස නියෝගයක් පැනවීය.

දින කිහිපයක් ගත විය. එහෙත් ප්‍රේමදාසගේ මහගෙදර පරිසරයේ වෙනසක් සිදුවූයේ නැත. මේ අතර දවසක ප්‍රේමදාසගේ පියාට පොලීසියෙන් හඳිසි කැඳවීමක් ලැබිණි. මේ මොන මංගල්ලයක්ද්වයි තැකිගත් ප්‍රේමදාසගේ පියා වහ වහා පොලීසියට ගියේය. හඳිසි කැඳවීමට හේතු විමසා සිටියේය.

"තමුන්නාත්තෙගෙ පුතා. ප්‍රේමදාස නාගරික මන්ත්‍රීතුමා අපට පැමිණිල්ලක් කරල තිබෙනවා. තමුන්ගෙ ගෙදර වටාපිටාව බොහොම අපිරිසිදුයිලු. කාණු උතුරනවලු. වැසිකිළිත් එහෙමලු. මේ නිසා ඒ පැත්තෙම පරිසරය අපවිත්‍ර වෙලාලු. මොකද මේකට කරන්නෙ? අපට සිද්ධවෙනව, ඔබව උසාවියට ඉදිරිපත් කරන්න..."



"පොලීසියේ" ප්‍රධානියාගේ කතාවෙන් ප්‍රේමදාසගේ පියාට යකා නැග්ගේය.

"හ්ම් එහෙනම්, අපේ එකා හදන්නෙ මාව පොලීසියට ගෙනල්ලා උසාවි යවන්න..." එසේ ගෝරනාඩු කළද තම පුතුගේ හැටි හොඳ හැටි දන්නා ප්‍රේමදාසගේ පියා මොහොතකින් සන්සුන් වූවේය.

"අනේ රාළහාමි ඕක දුරදිග ගෙනියන්න ඕන නැහැ. මම අද ගෙටම ඔය කාණු ටිකයි, වැසිකිළි ටිකයි පිළියෙළක් කරන්නම්..." එසේ පොලීසියට පොරොන්දුවක් දුන් ප්‍රේමදාසගේ පියා තම පුතාගේ කෙරුවාව ගැන හිතමින් ආපසු හැරුණේය.

ප්‍රේමදාස සහ පාද යාත්‍රාව

මේ කතාවත් ප්‍රේමදාස ගැනමය. 1992 වන විට ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ පාලනය මෙරටට එපාවෙමින් තිබිණ. ජනාධිපතිවරයාගේ ක්‍රියා කලාපයට හා ආණ්ඩුවට එරෙහි උද්ඝෝෂණද බලවත්ව නැගෙන්නට විය.

මේවා අතුරින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මූලිකත්වයෙන් සංවිධානය කළ පාද යාත්‍රාව විශේෂ තැනක ගත්තේය. දසදහස් ගණනක ජනතාව කොළඹ සිට කතරගමට පා ගමනින් ගොස් දෙවියන් ඉදිරියේ පොල් ගසා ආණ්ඩුව කුඩුපට්ටම් වන ලෙස යැදීම පාද යාත්‍රාවේ මූලික සැලැස්ම හා පරමාර්ථය විය.

පාද යාත්‍රාව කාලයට ගැලපෙන ආකාරයේ විරෝධතාවයක් බව බොහෝ දෙනෙකුගේ අදහස විය. මෙමඟින් ජනාධිපතිවරයා හා ආණ්ඩුව තුළ බියක් ඇතිකරවිය හැකි බව ද බොහෝ දෙනා විශ්වාස කළහ. එසේ තිබියදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා විපක්ෂයේ වෙනත් පක්ෂවල නියෝජිතයෝ පිරිසක් මෙම පාද යාත්‍රා විරෝධතාවය ප්‍රතික්ෂේප කරන්නට වූහ.

"වැඩේ නම් හොඳයි. ඒත් කොළඹ ඉඳල කතරගමට පයින් යන්න පුළුවන් කාටද? කකුල් ගෙවෙයි. ලෙඩ හැදිල මැරෙයි."

පාද යාත්‍රාව ප්‍රතික්ෂේප කරන්නන්ගේ ප්‍රජන වූයේ ඒවාය.

"ඔබේලට පිස්සු. කොහොම වුණත් මේ වැඩේට මිනිස්සු දහස් ගණනක් එනවා. ප්‍රේමදාස ලොක්ක හොඳටම බයවෙනවා. අපිට කතරගමට තියා වැල්ලවත්ත පාලම ලාටවත් යන්න දෙන්නෙ නැහැ. ගහන්න ඕඩර් එක දෙනවා" පාද යාත්‍රාව කෙසේ හෝ පවත්වනවාය යන මතයේ සිටි පිරිසගේ මෙම කතාව හමුවේ අදිමද කළ පිරිසේ සැර බාල විය.

අවසානයේ සියල්ලෝම එක මතයකට එළඹුණහ. දවැන්ත විරෝධතාවක් ලෙසින් පාද යාත්‍රාව සංවිධානය කෙරිණ. සංවිධායකයන් හිතුවාවත් වඩා වැඩේ සාර්ථක විය. දසදහස් ගණන් ජනයා ඊට එක්වන්නට කොළඹට ඇදී ආහ. විහාරමහාදේවී උයනෙන් ඇරඹුණු පාද යාත්‍රාව කිසිදු කරදරයකින් තොරව වැල්ලවත්ත පාලම පසු කළේය. එය මොරටුව පානදුර පසුකරමින් පළමු දිනය අවසන් කළද බලාපොරොත්තු වූ ආකාරයේ පහරදීමක් ආණ්ඩුවෙන් සිදුවූයේ නැත.

දෙවන දිනයද ආරම්භ විය. පාද යාත්‍රාව විරෝධයකින් තොරව ඉදිරියටම ඇදී ගියේය. පහරදීමක් පෙනෙන තෙක්මානයකවත් නොවීය.

"මාර වැඩෙනෙ වුණේ. අපි හිතුවෙ වැල්ලවත්ත හරියෙදිවත් ගහයි කියල. දැන් කළුතරත් පහුකරල. මේ යන ඉක්මණට මේකට මොනව හරි කළේ නැත්නම්, අපේ කකුල් ගෙවෙයි..." වැල්ලවත්තේදී ගුටි කා නිවෙස්වලට යාමේ බලාපොරොත්තුවෙන්, පාද යාත්‍රාවේ සිටි අතලොස්සක් දෙනා කන්කෙඳිරි ගාන්නට වූහ.

දසදහස් ගණන් ජනකායගේ සහභාගීත්වයෙන් කොළඹ සිට කතරගමට ඇදෙන පාද යාත්‍රාව දුටු ඒජාපයේ ඇතැම් දේශපාලඥයන් මෙන්ම සමහර පොලිස් ලොක්කෝ ද මහත් භීතියට පත්වූහ. ඔවුහු වහ වහා ප්‍රේමදාස ජනාධිපතිවරයා හමුවූහ.

"සර්, වැඩේ හරියන්නෙ නැහැ. පාද යාත්‍රාවට සෙනඟ වැහිච්චැලු. මීමැස්සො වගේ තවත් එකතුවෙනව. ගහල හරි, මොනව හරි කරල මේක නවත්වන්න වෙයි..."

පිරිසේ කතාව සාවධානයෙන් අසා සිටි ජනාධිපති ප්‍රේමදාස අත වූ පැතෙන් හිසට සිහින් තට්ටුවක් දමා ගත්තේය. කැරකෙන පුටුවේ අඩකයක් කැරකී පිරිසට පිටුපස හරවා මුහුණ බිත්තිය දෙසට යොමාගෙන ටික වේලාවක් කල්පනාවේ නිමග්න වූයේය. මොහොතකින් දිගු සුසුමක් හෙලූ ජනාධිපතිවරයා පුටුවේ ඉතිරි අඩකටය ද කැරකී තුණ්ණිම්භූතව තමා දෙස බලා සිටි පිරිස අමතන්නට පටන් ගත්තේය.

"දැන් ඔය පාද යාත්‍රාව යන්නෙ කොහාටද?" ජනාධිපතිවරයා හීන්සීරුවේ ප්‍රශ්න කළේය.

"කොළඹ ඉඳන් කතරගමට..." පිරිස පිළිතුරු දුන්හ.

"ඉතින් එහෙනම්, අපි මොකටද ඕකට ගහල නිකම් කැත නම ගාගන්නෙ. ඔය කට්ටිය කතරගමට යනකම් පයින් ගිහින් දෙවියන් එහෙම වුණ නිවාඩු පාවිච්චි වාහනවලින් කොළඹට එයි. කතරගම ඉඳන් මහ සෙනඟත් එක්ක කොළඹට එනවනම් තමා අපි එතනදීම ඕක නවත්වන්න ඕන. ඔන්න ඕකට පාඩුවේ යන්න දෙනවලා"

ජනාධිපතිවරයාගේ වචන යළි වෙනස් නොවන බව දන්නා පිරිස හිස් අතින්ම ආපසු හැරුණෝය. ප්‍රේමදාසගෙන් ගුටිකා වැල්ලවත්තෙන් ආපසු හැරී එමේ බලාපොරොත්තුවෙන් පාද යාත්‍රාවට එක්වූ දේශපාලඥයන් අතලොස්ස කකුල් ගෙවෙනතුරු කතරගමටම පයින් ගියහ.

පැතුම් ගජනායක

පසු කාලීනව තමාගේත්, තමා වටා සිටි පිරිසගේත් අඩුපාඩුකම් නිසා බරපතල විවේචනයකට බඳුන් වුවත් ඔහු මෙරටට කළ සේවයද මහත්ය. ඒ බව ඔහුට ප්‍රියකරන අය පමණක් නොව ඔහුගේ විරුද්ධවාදීහු ද පිළිගනිති.